**රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2018**
**------------------------------------------------------**

**මතය**
**------**

රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 17(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**
**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 119 (ඇ) ප්‍රකාරව අස්ථිත්වයක් විසින් ශුද්ධ වත්කම් ප්‍රකාශනයේ මුහුණතෙහි ශුද්ධ වත්කම් සංරචකයන්ට අදාල වූ ප්‍රමාණය වෙන වෙනම අනාවරණය කල යුතු වුවත් විද්‍යායතනය විසින් රඳවාගත් ලාභ පමණක් ඇතුලත් කර එම ප්‍රකාශනය පිළියෙල කර තිබුණි. | 2019 වර්ෂයේ සිට නිවැරදිව ඉදිරිපත් කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කල යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වලට අදාලව ධාරිතා සංවර්ධන සඳහා ලැබී තිබුණු එකතුව රු.3,246,685 ක් වූ පුනරාවර්තන ස්වභාවයේ ප්‍රාග්ධන ප්‍රදාන, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් ලෙස ගැලපීම වෙනුවට වත්කම් යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් දේපල පිරියත හා උපකරණ හා ප්‍රාග්ධන ප්‍රදාන එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | පුනරාවර්තන ස්වභාවයේ ප්‍රාග්ධන ප්‍රදාන හඳුනාගෙන නිසි පරිදි ගිණුම්ගත කල යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ණයහිමි ශේෂය රු.7,964,770 ක් වුවද, ලෙජර් ගිණුම අනුව එම ශේෂය රු.5,627,032 ක් වූයෙන් රු.2,337,738 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ලෙජර ගිණුම් නිවැරදිව පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) ආයෝජන යටතේ දැක්විය යුතු රු.714,000 ක් වූ ස්ථාවර තැන්පතු වටිනාකම මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | නිවැරදි වර්ගීකරණය යටතේ ගිණුම් වල හෙළිදරව් කල යුතුය. |
| (ඈ) ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන වලට අදාල ගිණුම් ශේෂවල යම්කිසි දෝෂයක් වෙතොත් එම දෝෂ නිවැරදි කිරීමේදී අනුමත ජ'නල් යෙදීමෙන් නිවැරදි කල යුතු වුවත් එසේ ජ'නල් සටහන් යෙදීමකින් තොරව ආරම්භක ශේෂ වෙනස්කර ලෙජරයේ ඉදිරියට ගෙනවිත් තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | අනුමත ජ'නල් සටහන් මගින් පමණක් ගිණුම්වල වැරදි නිවැරදි කිරීම් කල යුතුය. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනයේ ප්‍රතිපත්ති අනුව ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ) 5,6 ට අදාල පාඨමාලා පැවැත්වීම වුවද මෙම විද්‍යායතනය විසින් එම පාඨමාලාවලට අදාල බාහිර කථිකාචාර්ය හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා ගාස්තු ගෙවීම් කිරීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා ජාතික වෘත්තීය සුදුසුකම (NVQ 7) පාඨමාලා සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛ පදනම් කර ගනිමින් විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුල රු.4,928,200ක් ගෙවා තිබුණි. | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ සහ වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ අනුමැතිය ඇතිව චක්‍රලේඛය ප්‍රකාරව ගෙවීම් සිදුකර ඇත. | විධිමත් අනුමැතිය මත හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතුය. |

### 1.5.5 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | නිලධාරින්ට දීමනා හා වෙනත් මූල්‍යාධාර ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවද විද්‍යායතනය පාලක මණ්ඩලයේ අනුමැතිය මත පිළිතුරු පත්‍ර ලකුණු කිරීම, සිසුන්ගේ පාඨමාලාවලට අදාල විභාග රාජකාරී සඳහා ගෙවීම් කිරීම හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.1,743,550ක් ගෙවා තිබුණි. | සිසුන් බඳවා ගැනීම සඳහා පැවති විභාග රාජකාරි සඳහා විද්‍යායතනයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත ගෙවා ඇත. එසේම පිළිතුරු පත්‍ර ලකුණු කිරීම, සිසුන්ගේ පාඨමාලාවලට අදාලව පැවති විභාග සුපරීක්ෂණය වෙනුවෙන් හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබාගෙන ඇත. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,100,694 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 8,511,970 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,612,664 ක වර්ධනයක් විය.ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මුළු මෙහෙයුම් වියදම් රු.13,090,905 කින් වැඩි වී තිබුණද මුළු ආදායම රු.22,703,569 කින් වැඩි වී තිබීම මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනය පවත්වාගෙන යනු ලබන රූඩ් 03 පර්චස් 3.9 ක් වූ ඉඩමේ නීත්‍යානුකූල හිමිකම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් විද්‍යායතනය වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | විද්‍යායතනය පවත්වාගෙන යනු ලබන ඉඩමේ නීත්‍යානුකූල හිමිකම විද්‍යායතනයට පවරා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. | ඉඩමේ අයිතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ නිකුත් කරන ලද විභාග ප්‍රතිඵල අනුව වර්ෂය තුල පැවැත්වූ විභාග 03කට අදාලව විෂයන් 39 ක සමත්වීමේ ප්‍රතිශතය සියයට 0 සිට සියයට 56 දක්වා වූ පරාසයක පැවතුණි. | සිසුන්ගේ ප්‍රතිඵල වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට ක්‍රියාත්මක කර ඇත. | සිසුන්ගේ ප්‍රතිඵල අඩු වීමට හේතු පරීක්ෂා කර ප්‍රතිඵල වැඩි කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් විද්‍යායතනය වෙත ලබා දී තිබූ එකතුව රු.7,354,801 ක් වූ විද්‍යාගාර උපකරණ විගණිත දිනය වූ 2019 පෙබරවාරි 01 වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | රසායනාගාරයේ කටයුතු අවසාන වූ වහාම ඉහත උපකරණ මෙන්ම අනෙකුත් උපකරණද වඩා ඵලදායී ලෙස භාවිතා කිරීමට හැකියාව ලැබෙනු ඇත. | සම්පත් උපරිම කාර්යක්ෂමතාව යෙන් හා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කලමනාකරණ සහකාර නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සම්බන්ධයෙන් වූ 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුමත කරන ලද 2013 මැයි 21 දිනැති බඳවා ගැනීමේ පරිපාටියේ 4.4.5 වගන්තිය අනුව වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි විභාග පැවැත්වීම කලමනාකරණ මණ්ඩලයේ වගකීම වුවද විද්‍යායතනයේ කලමනාකරණය බඳවාගැනීමේ පරිපාටිය අනුව උචිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට ක්‍රියාකර නොතිබුණි. | 2018 ජූලි 02 දින කාර්යක්ෂමතා කඩඉම් සඳහා යොමුවිය යුතු සියලු නිලධාරීන් සඳහා යොමුකල අතර ඔවුන්ගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පාලක සභා අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. | අවශ්‍යතාවය පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2014 ජනවාරි 22 දිනැති අංක DMS 1670 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලිපිය ප්‍රකාරව විද්‍යායතනය වෙත අනුමත කරන ලද අනධ්‍යන කාර්යමණ්ඩල ලෙස ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී හා පුස්තකාලයාධිකාරී තනතුරු එක බැගින් අනුමත කර තිබුණද විද්‍යායතනය සඳහා අනුමත කර නොගත් සහකාර ලේඛකාධිකාරී, සහකාර මූල්‍යාධිකාරී හා සහකාර පුස්තකාලයාධිකාරී තනතුරු සඳහා බඳවාගෙන තිබුණු අතර එවැනි තනතුරු විද්‍යායතනය වෙත අනුමත කරවාගෙන නොතිබුණි. | සහකාර මූල්‍යාධිකාරී, සහකාර පුස්තකාලයාධිකාරී තනතුරු අනුමත කර ගැනීම සඳහා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමුකර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මැයි 11 දින තොරතුරු තාක්ෂණ උපදේශකවරයෙකු බඳවාගෙන තිබුණු අතර විද්‍යායතනය වෙත අනුමත කල කාර්ය මණ්ඩල බඳවාගැනීමේ පරිපාටිවල හෝ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බඳවාගැනීමේ පරිපාටියන්හි එවැනි තනතුරකට අදාලව බඳවාගැනීමේ පරිපාටියක් අනුමත කර නොතිබීම හේතුවෙන් බඳවාගත් නිලධාරින්ගේ සුදුසුකම් සනාථකර ගැනීමට විගණනයේදී නොහැකි විය. | තොරතුරු තාක්ෂණ උපදේශකවරයෙකු බඳවා ගැනීම සිදුකර ඇත්තේ අනුමත කාර්ය මණ්ඩල U-AST කාණ්ඩයට අනුව ඊට අනුරූපී බඳවාගැනීම් පටිපාටිය වන ගුරු සහායක කාණ්ඩය අනුව බඳවාගැනීම් සිදුකර ඇත. තවද මෙම තනතුර විශ්වවිද්‍යාල විද්‍යායතන ආරම්භයේ සිට බඳවාගැනීම් සිදුකර ඇත්තේ මෙයට අනුකූලව වන අතර විශ්වවිද්‍යාල විද්‍යායතන සියල්ල මගින් මෙයට බඳවාගැනීම් පටිපාටියක් සකසා ගැනීමට කටයුතු කරමින් පවතී. | නිශ්චිත බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කරවා ගත යුතුය. |
| (ඈ) විද්‍යායතනය පවත්වාගෙන යන පාඨමාලා සඳහා අවම වශයෙන් කථිකාචාර්යවරු 02 දෙනෙකු බැගින් සිටිය යුතු වුවද පාඨමාලා 03ක් සඳහා කථිකාචාර්ය පුරප්පාඩු 03ක් පැවතුණි. | ආහාර තාක්ෂණ පාඨමාලාවට කථිකාචාර්යවරුන් දෙදෙනෙකු අනුයුක්ත කර ඇති අතර එක් කථිකාචාර්යවරියක විදෙස්ගතව අධ්‍යාපනය ලබන අතර අනෙක් පාඨමාලාව වන රූපවාහිනී පසු නිෂ්පාදන පාඨමාලාව කථිකාචාර්ය තනතුර සඳහා බඳවාගැනීම් පටිපාටියට පවත්වා කලමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාල පාලක සභාව අනුමැතිය අපේක්ෂා කර සිටී.<br><br>විලේපනවේදය පාඨමාලාව සඳහා සිසුන් අවම මට්ටමක පවතින හෙයින් 2019 වර්ෂයේ පාඨමාලාව ආරම්භ නොකල අතර සේවය කල කථිකාචාර්යවරියද සේවයෙන් 2019 ජනවාරි 31 දින සිට ඉවත්ව ගියාය. මේ සඳහා බඳවාගැනීමට සඳහා පුවත්පත් දැන්වීමක් පළකරන ලදී. | පුරප්පාඩු පිරවීමට කටයුත කල යුතුය. |